# 02

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2015, Vol. 4 (II) 13-23pp
© The Author 2015
Ed. *Tissa Weerasekara*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# සර්වකාලීන සමාජ සංස්කෘතිය විනිවිද දක්වන උමංදාව (සමාජයීය සාහිත්‍ය අධ්‍යයනයක්)

**හර්ෂණී මිල්ලගහතැන්න**[1]

## Abstract

The sole purpose of Literature is to guied the reader from gestaelic exprerience to wisdom. It is a general norm of arts. Literature often creates a good environment eliminating evils from the society in order to make it a better place for living. Also literature is affine medium of communication classical work to voice our thoughts to others.Universal sociel reality can also be demoastrated.through the syncronic study of the Pansiys Panas Jathaka .It is a treasure trave in any study of social reality.Ummagga Jathakas is one of the stories of Pansiya Panas Jathaka.This reveals the universal norms of the social political, economics, cultural and religious tendencies.It is erstel clear that the content of that very story shows us the human centred exehad norms. It is kevefor essential to discuss such aspects of human social culture an examplese to the society in the 21st centurary.

**Key word**: Literature, Ummagga Jathaka, Human Social Culture

[1] *කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.* harshimtc2010@yahoo.com./chamamth@gmail.com.

### හැඳින්වීම

කලාවේ පරමාර්ථය ආනන්දය තුළින් ප්‍රඥාව කරා පාඨකයා මෙහෙය වීමයි. එය සියලු කලාවන්ට පොදු ධර්මතාවකි. සාහිත්‍ය කලා වනාහි සමාජයේ වූ නිෂේධනීය තත්වයන් ඉවත්කර සාධනීය තත්වයන් වගාකිරීමට සුදුසු සමාජ ශෝධකත්වය නිරතුරුව සපයනු ලබන්නකි. සාහිත්‍ය කලාව හා අනන්‍ය වූ සහෘද පාඨකයා ඒ මඟින් තම හැඟීම් විරේචනය කරනු ලබයි. සාහිත්‍යයේ ප්‍රාවර්ථීක (synchronic study) අධ්‍යයනය හරහා ඒ තුළ අන්තර්ගත සර්වකාලීන වූ සමාජ සත්තා යථාර්ථය මතුකරගත හැකිය. අපගේ සම්භාව්‍ය සාහිත්‍යට අයත් පන්සිය පනස් ජාතක පොත වූ කලී සමාජ සත්තා යථාර්ථය විනිවිද දක්වන සර්වකාලීන අගයකින් යුත් සාහිත්‍ය කෝෂ්ටාගාරයකි.

ඕනෑම කෘතියක් සමාජ සාහිත්‍ය අධ්‍යයන මඟින් විමසීමට ලක් කිරීමේදී තත්කාලීන සමාජ ප්‍රවනතා, දූර්වලතා, අපේක්ෂා හා ප්‍රාර්ථනා පිළිබඳව යථාරූපී සිතුවමක් ප්‍රතිනිර්මාණය කරගැනීමට ඉඩකඩ සැලසේ.

පන්සිය පනස් ජාතකපොතට අයත් උම්මග්ග ජාතක කතාව සමාජ සාහිත්‍යය අධ්‍යයන ක්‍රමවේද ඔස්සේ විමසීමේ දී සර්ව කාලීන අගයකින් යුත් සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික ප්‍රවණතා පිළිබඳ විශ්වීය ධර්මතා අනාවරණයවන සුවිශේෂ කෘතියක් ලෙස හඳුනාගත හැක. එහි අන්තර්ගත හරය වනාහි දේශ, කාල, ජාති, ආගම් භේදයන්ගෙන් විනිර්මුක්ත, සර්වකාලීනව පහළවන මානව කේන්ද්‍රීය ධර්මතා බව මනාව ස්ඵුටවන සත්‍යයකි. එමෙන්ම එකුන්විසිවන සියවසෙහි ඕනෑම මානව සමාජ සංස්කෘතියක හැඩතල ඒ තුළින් මොනවට විවරණය වීම විමසිය යුත්තකි.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ මූලික ක්‍රමවේදය වන්නේ මූලාශ්‍ර අධ්‍යයනයයි. එහිදී ද්විතීයික මූලාශ්‍ර ප්‍රධාන වෙයි. ඒ සියල්ල අදාළ විෂයට සම්බන්ධව සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යායන් සමඟ තුලනය කිරීමක් ද සිදුකෙරේ.

සෑම ජාතියකට ම අයත් සම්භාව්‍ය සාහිත්‍ය කෘති මඟින් එම සමාජවල විසූ සාමාජිකයන් කෙබඳු සමාජ භූමිකා නිරූපණය කළේදැයි එකී කෘති පරිශීලනයෙන් අවබෝධ කරගත හැකිය. මෙතුළින් නිරූපණය වන්නේ ඒ ඒ සමාජ, දේශපාලන හා ආර්ථික ඉතිහාසය සහ එම සමාජය තුළ සිදුවූ සමාජ සංස්ථාගත වෙනස්කම් ආදියයි (පල්ලියගුරු, 2002:31). එය නූතන සමාජ, දේශපාලන බලවේගයන් හා ඓන්ද්‍රීය වශයෙන් බැඳී පැවතීමත්, ඉහත තත්ත්වයන් වත්මන් ප්‍රවණතාවන්ගේ ම ආදිකාලීන හැඩතලයන් ලෙසත් සැලකීම යුක්ති යුක්ත වන්නේ ය. එය චක්‍රාකාරව ගමන් කරමින් යුගයෙන් යුගයට වෙනස් මුහුණුවරකින් පෙනී සිටී. සමාජීය සාහිත්‍ය අධ්‍යයන තුළින් උක්ත තත්ත්වයන්ගේ ස්වභාවය අවබෝධ කරගත හැකිය. ජනතාවගේ සභ්‍යත්වයත්, බුද්ධි විකාශනයත් විනිශ්චය කිරීමට ඔවුන්ගේ සාහිත්‍යය කලා උපකාර වෙයි. සාහිත්‍ය වූ කලී සභ්‍යත්වයෙහි වැඩීම, බස දන්නවුන්ට පමණක් ඇසෙන සේ කියා පෑමකි (වික්‍රමසිංහ, 1946:13).

ජාතක කතා වූ කලී ඈත අතීතයේ පටන් ම පොදු ජනයාගේ ජීවිතය කෙරෙහි බලපෑමක් ඇතිකොට එයින් ඔවුන්ගේ ජීවන දර්ශනය සකස්කළ ආකාරය සැලකිල්ලට ගත යුත්තකි (මහේෂ, 1996:11). පැරණි භාරතීය සමාජය තුළ පැවති විවිධ සම්බන්ධතා හා සංස්කෘතික ලක්ෂණ පමණක් නොව පොදුජන ජීවිතයේ සෑම ක්‍රියාකාරී අංශයක් පිළිබඳව ම ඉතා වැදගත් වූත්, සනාතනික වූත් තොරතුරු ජාතක කතා මගින් ඉදිරිපත් කරඇත (පෙරේරා, 1993:30). ලෝක සාහිත්‍යයෙහි පුරාණතම ජනශ්‍රැති සංග්‍රහය ජාතක කතාවෙයි.. එය ලෝ පුරා විසිරී පැතිර ඇති බෞද්ධ පාඨක වර්ගයා ජාතකපොත අග්‍රස්ථානයෙහිලා වැඳුම් පිදුම් කරන බැවින් ජාතක පොත පැරණි බෞද්ධයාගේ සිතුම්පැතුම් ඉපදී වැඩීමට උරදුන් වීර කාව්‍යයක් වැන්න. නවාංග ශාස්තෘ ශාසනයේ සත්වන අංගය ජාතක පාලිය වන බැවින් කතා ලොවෙහි ජාතක කතාවලට හිමිවන්නේ වෙසෙස් තැනකි. ඛුද්දක නිකායට අයත් ජාතක ගාථා පාලියෙහි විස්තර ව්‍යාඛ්‍යාන සංග්‍රහය වන්නේ ජාතකට්ඨ කථාවයි. චූලවංශාගත තොරතුරු අනුව මෙකී ජාතකට්ඨ කතාව කුරුණෑගල සමයෙහි "පන්සිය පනස් ජාතක පොත" නමින් හෙළ බසට පරිවර්තනය විය (කුලසූරිය, 1997:6).

එනමුත් හෙළ බසට පරිවර්තනය වීමට පෙර පවා ඇතැම් ජාතක කතාවෝ තත්කාලීන සමාජයෙහි වූ බවට සාධක ග්‍රන්ථාගතව පැවතී ඇත්තාහ. එවන් එක් ජාතක කතාවක් ලෙස උම්මග්ග ජාතකය හඳුනාගත හැක.

ලොව පුරා බෞද්ධ රටවල විවිධ නිර්මාණ කාර්යය විෂයෙහිලා උම්මග්ග ජාතක කතා පුවත ආශ්‍රය කරගත් බවට තොරතුරු සටහන්ව තිබේ. ටිබෙට් බසට නැගුණු කන්ජුරි සාහිත්‍යයෙහි උම්මග්ග ජාතකයට සමාන කතා පුවතක් අන්තර්ගතව ඇතිවා සේම ක්‍රිස්තු පූර්ව දෙවන ශතවර්ෂයට අයත් භාරුත්හි කැටයම් තුළ ද උම්මග්ග ජාතකයට අයත් අවස්ථා කිහිපයක් නිරූපිත ය (ද සිල්වා, 1965:8-10). මින් සනාථවන්නේ උම්මග්ග ජාතකය වෙනම කතාවක් වශයෙන් ඈත අතීතයේ සිට සුප්‍රසිද්ධව පැවතුණු බවයි. උමංදාවේ ප්‍රධාන කතා පුවත උමගක් කැනීම ඇසුරින් සකස් වූ එකකි (එළුඋමංදාව,1950). පසුකාලීනව "උමංදා පුවත" , "මහෞෂධ පඬිතුමා ප්‍රශ්න විචාරීම", "වේදේහ බිසෝකවි", "වේදේහ සිංදුව", "රතිවති කතාව"(සන්නස්ගල, 1961) වැනි නිර්මාණ බිහි විය.

"උම්මග්ග" යන්නෙහි වදනරුත වන්නේ "උමග" හෙවත් බිම් ගෙය යන්න යි. උමගක් කරවීමෙන් බෝසත් තෙමේ තම උපා ඤාන විදහා ලූ අයුරු තත් කතා පුවතින් නිරූපිතය. උපාඤාන, නුවණ, ප්‍රඥාව යන ගැඹුරු අරුත් "උම්මග්ග" යන වදනින් අර්ථ ගැන්වේ. එබැවින් උම්මග්ග ජාතක කතාව වනාහි බෝධිසත්වයන්ගේ ප්‍රඥා පාරමිතාවේ අගය විනිවිද පෙන්වාලන කතාවකි. උමංදාවට වස්තු වූයේ දේව කතා හෝ පෙළහර තකා නොව බුද්ධි ගෝචර සමාජයේ වූ සජීවී චරිත කතාවන් කිහිපයකි (වික්‍රමසිංහ, 2005,132). එය පවත්නා සමාජ සන්දර්භයෙහි සාධනීය සහ නිශේධනීය තත්ත්වයන්හි සැබෑ පිළිඹිබුවකි. බොහෝ බෞද්ධ කතා වස්තූන්ට පසුතලය වූයේ පුරාණ සමාජයයි. උමංදාවට පසුබිම් වූයේ ද කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි සුප්‍රකට නගරයකි. මේ තුළ අන්තර්ගත වන්නේ එවැනි නගරයකට උචිත වන්නා වූ පසුබිම් පෙළ ගැස්මකි.

උමංදාව බමුණුකුලය පරදා ගොවිකුලය ඉස්මතුවීම පිළිබඳ වෘත්තාන්තයක් බව ඇතැමෙක් දරණ මතය වුවද එය එසේ නොවන්නේය. කඩතුරා මැත්කර උමංදාව යථාර්ථවාදී ලෙස විමර්ෂණය කිරීමෙන් අනාවරණය වන්නේ තත් යුගයේ පැවැති දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික වටපිටාව මෙ මගින් පිළබිඹුවන බවයි. මේ පසුබිම සැකසීමට මෙහෙයවූ තත්කාලීන මනුෂ්‍ය චිත්තසන්තානගත චෛතසිකයන් සර්වකාලීන ය. සදාතනිකය. විශ්වීය බවක් හොබවන්නේ ය. සාහිත්‍ය පෝෂණය වන්නේත්, වර්ධනය වන්නේත් සමාජයේ පවතින පුද්ගල හා අනිකුත් විවිධ බලවේගයන් මඟිනි. කිසියම් යුගයක සාහිත්‍යය ඍජුව හෝ වක්‍රව හෙළිදරව් කරන්නේ එම යුගයේ පවතින මුඛ්‍ය ආකල්පයන් ය (පල්ලියගුරු, 2002:22).

"ජනකතා හා පැරණි සාහිත්‍ය ග්‍රන්ථ ද ,අලුත් සාහිත්‍ය ග්‍රන්ථ ද සමාජයෙහි හා ජාතියෙහි අමනොඥ ගති දුරුකිරීමට ඉවහල් කොටගත හැකි බලසම්පන්න අවියකි. ඒ ඒ කාලයෙහි වෙසෙන ලේඛකයන්ට ග්‍රන්ථ රචනා කරනු සඳහා වුවමනා දේ සපයන්නේ සමාජයයි. ඒ රචනා ඒ ඒ කාලයෙහි සමාජයෙහි පැවැති චරිත පිළිබිඹු කෙරෙන කැටපත් වෙයි. ගද්‍ය පද්‍ය කාව්‍ය නැමැති කැටපත්වල සමාජගත චරිතයන්හි උසස් අංශ මෙන්ම හීන දීන අංග ද පිළිබිඹු වෙයි. හීන දීන අංග පිළිබිඹු වන්නේ කතුවරයන් කියන ඒ අංග දැකීමෙන් උදහස්ව කරන සරදම් ද, නගන සිනාද කියන ඇණුම් බැණුම් ද සමඟ ය". (වික්‍රමසිංහ:126-127).

උම්මග්ග ජාතකය සමාජයීය සාහිත්‍ය ප්‍රවණතා ඔස්සේ අධ්‍යයනයට ලක්කිරීමේ දී සංකීර්ණ වූ සර්වකාලීන සමාජ සංස්කෘතික වටපිටාවක් ප්‍රතිනිර්මාණය වේ.

"තරුණවිය නොඉක්මවූ ගොවියා පුතු මහෞෂධයන් ස්වකීය ප්‍රඥාවෙන් හා වයසින් මුහුකුරා ගිය බලයෙන් ද අගතැන්පත් රජුන් හා බමුණන් තම දෙපා මත දණ ගැස්වීමේ පුවතක් ගැන කියවෙන කතාවකි, උම්මග්ග ජාතකය. වර්තමාන ව්‍යවහාරය අනුව සලකන විට එය පංති ගැටුමක් විග්‍රහ කරමින් පහළ පැළැන්තිය හෙවත් වැඩකරන ජනයා නියෝජනය කරන පක්ෂයෙහි ජයග්‍රහණයක් කියාපාන කෘතියක් සේ හැඳින්විය නොහැකිද?" (සුරවීර, 2002:76). මානව සිතුම්පැතුම්වල සජීවී දසුන් මෙහි අන්තර්ගතවන බව මනාව ස්ඵුට වන සත්‍යයකි.

උම්මග්ග ජාතක කතාවට පසුබිම් වී ඇත්තේ උතුරු ඉංදියාවේ විදේහය සහ උත්තර පංචාලය අවට ප්‍රදේශයයි. පංචාලයට බටහිරින් වූයේ කුරු රාජධානියයි. උත්තර පංචාලය ලබාගැනීම පිණිස කුරු පංචාල අතර නිතර යුධගැටුම් පැවතිණි. උම්මග්ග ජාතක කතාවට අනුව මේ මහජනපද යුගය වෙයි. පංචාලය මහජනපද 16න් එකකි. මෙකල බෙලහීන රාජධානි බලවත් රාජධානි විසින් යුද්ධයෙන් හෝ වෙනත් උපක්‍රම මඟින් යටත් කර අධිරාජ්‍ය ගොඩනැගීය. උත්තර පංචාලයේ රජු සිතන්නේ එක් සියයක් රජුන් පරදා රාජ්‍ය ගෙන මුළු දඹදිවට අගරජ වන්නට ය. ඒ සඳහා ක්‍රියා කරන ආකාරය පිළිබඳ කතන්දරයක් එනම් රාජ්‍යාන්තර බල අරගලයක් උම්මග්ග ජාතකය පුරා දිව යයි.

මෙම කතා වස්තුවෙහි මතුපිටින් කුල අර්බුදයක් දිස් වුව ද ඉන් නිරූපනය වන්නේ බල අර්බුදයක් බව පැහැදිලි ය. මහෞෂධගේ සමාජ හිතකාමී ක්‍රියා කලාපය නිසා ගැමියන් ඔහුට මහත්සේ සලකනු ලැබීය. එය ඇසූ වේදේහ රජු සිතන්නේ තමාගේ බලය අඩුවී මහෞෂධ බලවත් වන බවකි. රජු ඔහුව රජ මාලිගයට කැදවන්නේ මහෞෂධගේ දැනුම නිසා ම නොව තම දුර්වල

පාලනය යටතේ රඳාපැවැත්ම උදෙසා මහෞෂධ සාධකයක් වන බැවිනි. ඉන් තම බල වර්ධනය සිදුවන බැවිනි (ප්‍රනන්ද, 1985:96). මෙය සදාකාලින දේශපාලන න්‍යායක් පසක් කරන්නකි.

තත් යුගයේ ද මෙකී න්‍යාය දියුණු දේශපාලන ක්‍රමවේදයක් වූ බවට සාධක ලැබේ. ඒ අතර යුධ උපක්‍රමවලට ලැබෙන්නේ සුවිශේෂී ස්ථානයකි. දියුණු චරපුරුෂ සේවාවක් වූ බව මහෞෂධගේ ක්‍රියා කලාපයෙන් හෙළි වේ. ඔහුට ඒ මඟින් තම සිතැඟි ඉටුකර ගැනීමට මනා මෙහෙයක් ලැබිණ. මිනිසුනට අමතරව පක්ෂීන් ද ඒ සඳහා යොදා ගත්තේ ය.

යුද්ධ කිරීමේ ක්‍රමෝපායන් රැසක් මෙයින් අනාවරණය වේ. මියුලු නුවර වටලාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත්වන අදහස් වූ කලී එකල රාජ්‍යයන් තුළ පැවැති දියුණු යුද්ධෝපායන් හා හමුදාවන්ගේ ශක්තීන් නිරූපණය කරයි." පළමුව ඇත් පවුරෙක් දෙවනුව අස් පවුරෙක් තුන්වෙනුව රථ පවුරෙක් සිව්වෙනුව යෝධ පවුරෙක් කැයි මෙසේ සතර වළල්ලක් හා අස් වළල්ලට අතරෙහි එක් වීථියෙක රථ වළල්ලට හා බල වළල්ලට අතරෙහි එක් වීථියක මෙසේ තුන් සන්ධියකින් වටකරන ලද විදේශ රාජධානිය....." (උම්මග්ග ජාතකය, ගම්ලත්;546-2472).

ධර්ම යුද්ධය වූකලී යුධ කඳවුරු හකුළා නොගෙන ම සාකච්ජා මාර්ගයෙන් උපායමාර්ගිකව පසුබැස සාකච්ජා මඟින් ඊළඟ යුධ වටය සඳහා සූදානම් වීමකි. මෙකී තත්ත්වය වර්තමානයේ ලොවපුරා ක්‍රියාත්මක වන්නාවූ සාමාන්‍ය සම්ප්‍රදායයි. මෙහි වෙනස් වී ඇත්තේ නාමය පමණකි. මෙය වත්මනෙහි ක්‍රියාත්මක වන්නේ දෙයාකාරයකිනි. ආයුධ සන්නද්ධ මැදිහත්වීමත් හා ආයුධ රහිත මැදිහත්වීම මේ දෙයාකාරයයි. ආක්‍රමණික හමුදා ආයුධ සන්නද්ධ සටනෙකින් පරාජයවන බව හැගෙනවිට හට සේනා ස්ථානගත කරමින් පසුබසින බව නොඅඟවා දූත මෙහෙවරකින් සාකච්ජා මේසයට කැඳවමින් එමඟින් ප්‍රශ්න නිරාකරණය කරගැනීමත් අවසානයේ දී යටත් ගිවිසුම්වලට කොටුකර ගැනීමටත් සැලසුම් යොදනු පෙනේ. මෙවැනි උපක්‍රමවලට යුද්ධයේ ද්වෛධීභාවය යැයි පැරැන්නෝ කීහ. වර්තමානයේ දී මෙවැනි කාර්යයන් සඳහා මධ්‍යස්ථ සේ පිළිගැනෙන තුන්වැනි රටක් යොදා ගැනීම මඟින් "ධර්ම යුද්ධය" ප්‍රකාශ කරයි. (ප්‍රනන්ද, 1985:114) තවත් යුධ උපායක් වන්නේ සතුරාගේ ආත්ම ශක්තිය හීනකිරීම සහ ප්‍රමාණය ඉක්මවා කේන්ති ගැන්වීමයි. ඒ බව මියුලු නුවර වැටලූ අවස්ථාවේ ඇතුළු නුවර දින හතක් පුරා උත්සව පැවැත්වීමෙන් පැහැදිලි වෙයි.

උම්මග්ග ජාතකයෙන් හෙළිවන්නේ එක් අතකින් කුල අර්බුදයක් ම නොවන බව මින් ගම්‍ය වේ. සේවක වැටුප් ප්‍රශ්නත්, වැඩවර්ජනත් ඒ හේතුවෙන් මතුවන පාලක මතවාද එහි සියුම්ව අන්තර්ගත වන හරයයි. ඒ බවට හොඳම නිදසුන වන්නේ කකණකට ප්‍රශ්නයයි. මහෞෂධගේ ද අනුදැනුම පිට වාසල් දොර සේවකයාට වැටුප් නොලැබීම හේතුවෙන් හෙතෙම සේවා වර්ජනයක යෙදිණි. රජුට රත්තරන් වටිනා සේ ඔහුට ශ්‍රම ශක්තිය අගනේ ය. එබැවින් වැඩ වැරීය. නමුත් පාලකයන් එය දකින්නේ සේවකයන්ගේ අහංකාරකමක් ලෙසිනි (ප්‍රනන්ද, 1985,102). මෙවැනි සදාතනික පාලක පාලිත සබඳතාවන් පිළිබඳව අදහස් ද මෙහි නිරූපිත ය.

අනෙක් අතට පැහැදිලි වුත්, විනිවිද පෙනෙන නියම යථාර්තවත් නායකත්වයක් ගොඩනැගෙන ආකාරය උම්මග්ග ජාතකයෙන් හෙළි වේ. අවිහිංසක ජන පිරිසක් ඉදිරියේ කාය බලය, ධන බලය, මඟින් කැපී පෙනීමට වෙහෙසෙන හිස් මිනිසුනට සැබෑ ජනතා නායකත්වය යනු කුමක්දැයි පහදා දෙයි. එය පරම්පරාවෙන් උරුමවන්නක් නොවන බවත්, ජනතාව අතර වැඩ කරමින් ඔවුන්ගේ ප්‍රශ්නවලට නිවරැදිවුත්, යුක්ති සහගතවුත් විසඳුම් ලබා දී ජනතා සේවයේ යෙදී, ජනතා ආදරය දිනා ගනිමින් ජනතා හිතසුව පිණිස කටයුතු කිරීම හේතුවෙන් යහපත් නායකත්වයක් ගොඩනැගෙන බව මහෞෂධ චරිතයෙන් විශද වේ (ප්‍රනන්ද, 1985:96).

රට පාලනය කරන රජවරුන්ගේ දුබලකම් හා නිවටකම් කියාපෑමක් ද මේ තුළින් නිරූපිත ය. මෙහි එන රාජ චරිතද්වයම ස්ත්‍රී ලෝලීන් සේ ම බියසුළු, අදුරදර්ශී, බලලෝභී, ඉක්මනින් කිපෙන, අමන අමාත්‍ය මණ්ඩලයක් වටලාගත් දුෂ්චරිතයන් බව හුවාදක්වයි. එවැනි වූ පාලකයන්ට රටක් පාලනය කළ හැකිද යන්න පාඨකයාගේ සිතට නැගෙන ප්‍රශ්නයයි. වේදේහ හා බ්‍රහ්මදත්ත රාජ චරිතයන්ගේ ක්‍රියාකලාපයන්ගෙන් මේ බැව් ප්‍රකට වේ (ද සිල්වා, 1965 :66-82).

"නිර්මාණ කාර්යය වනාහි සමාජයක ව්‍යාකූලභාවයෙන් නිරාකූලභාවය ඇතිකරලීමේත් අව්‍යකෘත භාවයෙන් ව්‍යාකෘතභාවය ඇතිකරලීමේත් කාර්යයක් බව" ආචාර්ය මාක්ස් ස්කෝරර් පවසයි (Surmellan,1969:viii) . නිර්මාණ කාර්යය කවර යුගයක් නිරූපණය කළ ද එහි අන්තර්ගත චරිත හා ඒ චරිතයන්ගේ සාධනීය හා නිශේධනීය ක්‍රියාකලාපය දේශ, කාල, සමාජ හා සංස්කෘතික යන භේදයන්ගෙන් විනිර්මුක්තව සදාකාලික සත්‍යයක් සපථ කරයි. ඊට හේතු වන්නේ නිර්මාණයකට ගෝචර වන්නා වූ චරිත හා සිද්ධීන්හි හිමිකාරත්වය සමාජීය සත්වයා වූ මිනිසා මූලික කරගෙන සිදුවන හෙයිනි.

සැබවින් ම මෙහි නිරූපණය වන්නේ බ්‍රාහ්මණ කුලය පරදා ගොවි කුලය ඉස්මතුවීමක් නොව ක්ෂත්‍රිය කුලය පාගා තම සිතැගි ඉටු කරගන්නට වෙර දරන බමුණු කුලය ඉස්මතු වීමයි. කේවට්ටගේ මූලික අභිප්‍රාය වන්නේ හැකිතරම් සුඛෝපභෝගී ජීවිතයක් ගතකිරීමයි. ඒ සඳහා තම රජු දඹදිවට අගරජු කිරීමට පෙළඹෙයි. චූලනි රජු ද බල තණ්හාවෙන් එසේම ක්‍රියා කරයි. සේනක, පුක්කුස ආදී වූ වේදේහ රජුගේ අමාත්‍ය බමුණන් ද හැසිරෙනුයේ මේ ආකාරයෙන් ම ය. එබැවින් බමුණන් අත නැටවෙන රූකඩ ලෙස එකල රජවරුන්ගේ ස්වභාවය මෙමගින් මනාව නිරූපණය වෙයි (ද සිල්වා, 1965: 82-93).

දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන කුමන්ත්‍රණ පැහැරගැනීම් ආදියද මේ තුළ බහුලව දක්නට ඇත. කෞටිල්‍ය ලියූ "අර්ථ ශෘස්ත්‍රය" නම් ග්‍රන්ථයේ පැරණි භාරතීය රාජ්‍ය පාලනය ගැන විවිධාකාර විස්තර සටහන් ඇති අතර එය ඇරිස්ටෝටල්ගේ "දේශපාලන ශාස්ත්‍ර" නම් කෘතියට නොදෙවෙනි ය. කෞටිල්‍යගේ කෘතියේ වූ රාජ්‍ය පාලන ක්‍රම හා නීති ශාස්ත්‍ර ඊට පෙර විසූ රාජ්‍ය පාලකයන් අතර භාවිත වූ බවත්, එසේ ව්‍යවහාරයේ පැවැති නීති පද්ධතිය ශාස්ත්‍රීය ක්‍රමයකට සකස් කිරීමක් ඔහු අතින් වන්නට ඇතිබවත් සිතේ (පඤ්ඤාකිත්ති, 2001:161-206). උම්මග්ග ජාතකයෙහි දෘෂ්‍යමාන දේශපාලන ක්‍රියා දාමයන් දෙස බලන විට එය මනාව ස්ඵුට වෙයි. කෙසේ නමුත් එකල පවා ඉතා ප්‍රබල බුද්ධියකින් හෙබි අනුශාසකයන් වූ බවට කේවට්ට නිදසුන් සපයයි. ඔහු යසස් කාමයෙන් පෙළුණෙකි. සතරකන් මන්ත්‍රණය, වේදේහ

පංචාලණ්ඩි විවාහ යෝජනාව ඔහුගේ අතිශය කූට බුද්ධිය පෙන්වයි (ගම්ලත්, 1995:51-70). ධර්ම යුද්ධය ද එසේ ම ය. තත් යුගයේ රාජ්‍ය පාලන ක්‍රමවේදය සැකසී තිබුණේ සාම, දාන, භේද, දණ්ඩ යන සතර ආකාරයෙනි (අබේවර්ධන, 2004). මේ ක්‍රමවේදයෝ මහෞෂධ විසින් මැනවින් ක්‍රියාවේ යෙදවූහ. රාජ උපදේශකයන්ගේ සැබෑ තත්වය ද මෙහිදී කියාපායි. සේනක වනාහි වස්තු ලෝභයෙකි. වෛශ්‍යාවන් ඇසුරු කරන ඔහු මිනීමරුවෙකි. පුක්කුස පිළිකුල් සහගත දදයක් ඇත්තෙකි. කාවින්ද උමතුවකින් පෙළෙයි. දේවින්ද මැණික් සොරෙකි (ගම්ලත්, 1995:32-33). මින් පැහැදිලි වන්නේ උමංදාව වනාහි බමුණු කුලය පරදා ගොවිකුලය ඉස්මතුවීම පමණක් නොව රජු පිරිවරා සිටිමින් රාජ්‍ය පාලනයට උපදේශ සපයන්නන්ගේ යථාර්ථ නිරූපනයක් ද සිදුවන බවයි. මෙවැනි පිරිසක් සමඟින් රජකුගේ පසුතැවීම දක්වන්නේ සර්වකාලීන යථාර්ථයක් අනාවරණය කරමිනි (ද සිල්වා, 1965:68-69).

> "මම කෙහෙල් හර දිඹුල් හර සොයන්නෙකු සෙයින් මේ පඬිවරුන් ඇසුරෙන් සාරයක් නොලදිමි. නැවත පැන්නැගි මහ වනයක්හි විසූ මහ ඇතෙකු ගිම් සමයෙහි සර්මයෙන් පීඩිත වූවාහු සේ දුකට පැමිණි කල්හි දුකින් මුදා ගලවා ගන්නට තරම් වූ උපායක් නොදන්නා අඥානයන් සමීපයේ අනේ මා විසූ නියාව ඉතා නපුරුය" (උම්මග්ග ජාතකය, 2000:172-173).

මෙකල පැවැති යුද කටයුතු සේම රජ දඩුවම් ක්‍රම පිළිබඳව ද තොරතුරු තත් කෘතියේ අන්තර්ගත වේ. එපමණක් නොව රාජ්‍ය පාලනයේ සිදු වූ අකටයුතුකම් රාශියක් ද මෙහි නිරූපිත ය. බ්‍රාහ්මණයෝ රජුන්ට අනුශාසනා කිරීම පරවේණි ධර්මයක් කරගනිමින් ක්‍ෂත්‍රියයන් හා එක්ව පොදු ජනයා පෙළූහ. සාධු චරිතයෙන් හා බුද්ධි මහිමයෙන් ද සංග්‍රාම උපායෙන් ද ඔවුන් පරදා ජය ගැන්ම මහෞෂධ ඇතුළු පොදුජනයාගේ ජයග්‍රහණයකි. බලය, අධිපතිකම හා වස්තු ලෝභයෙන් හෙබි සේනකාදී පඬිවරුන් රජුගේ සිතැගි බලා ඉච්ඡා බස් තෙපලන්නට පුහුණු වූ මන්ත්‍රීන් බවත්, ඔවුන් හා එක්ව විසීමෙන් රජුට වූ අනර්ථය ද කියාපායි.

අදක්ෂ සෙන්පතියෙකු යටතේ මහ සේනාවක් සිටිය ද දක්ෂ සෙන්පතියෙකු යටතේ සිටින සංවිධානාත්මක වූ කුඩා සේනාවකට එම දක්ෂ සේනාව පැරදවිය හැකි බවද, රාජ්‍ය විචාල රජවරුන්ගේ අනුශාසකයන් රජුන් රවටා තමන්ට නියමිත වූ බලයට වඩා වැඩි බලයක් අත් කොටගත් බවත් උමංදාවෙන් පෙනේ (ප්‍රනන්දු, 1985:122). එමෙන්ම රාජ්‍ය බලය විචාරන්නට ගිය මහෞෂධයන්ට සිදුවූයේ උමගක් හාරා රජුට බිසවක් ගෙනත් දීමටයි. මෙයින් විශද වන යථාර්ථය සර්වකාලින ය. මහෞෂධයන් මුහුණ පෑ දුෂ්කරතා මෙකල දේශපානඥයකුට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතාවලට වෙනස් නොවේ. එනයින් ගත් කළ සර්වකාලීන වූ දේශපාලන තන්ත්‍රයක පුළුල් පැතිකඩක් උම්මග්ග ජාතකය තුළින් ගෙනහැරපායි (වික්‍රමසිංහ, 2005:143). එබැවින් මෙකී ජාතක සන්දර්භය තුළ අන්තර්ගත වන්නේ බමුණු කුලය පරදා ගොවි කුලය ඉස්මතුවීම පිළිබිඹු වූ කතාන්දරයක් පමණක්ම නොවේ.

ජාතකවලට පසුබිම් වූ සමාජය විශ්ලේෂණය කිරීමේ දී එක්තරා යුගයක සමාජය පැවති ආකාරය පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනීමට පුළුවන (පෙරේරා, 1993:30). තත්කාලින සමාජ හා සංස්කෘතික කරුණු රාශියක් ද උම්මග්ග ජාතකය තුළින් හෙළිපෙහෙළි වේ. පිංගුත්තරගේ කතාවෙන් මතුවන්නේ එකල පැවැති අධ්‍යාපන ක්‍රමයේ ස්වභාවයයි. පිංගුත්තර කුඩාකළ

දිසාපාමොක් ආචාර්යවරයාගෙන් ශිල්ප ලැබූවෙකි. උක්ත අතුරු කතා පුවත බමුණු විදුහල්වලටත්, ගුරුන්ගෙන් හා පොතෙන් ලද දැනුම ඇතත් ලෝක ව්‍යවහාර ඥානය හීනවුවන්ටත් එල්ලකළ සියුම් උපහාසයක් වැන්න. දිසාපාමොක් යන්න මෙකල උපකුලපති තත්වයක් බඳුයැයි සිතේ. උසස් ම ලෙස සමත්වූ පිංගුත්තරහට ලැබෙන ත්‍යාගය නම් කුලසිරිතට අනුව ගුරු දියණියයි. ගුරුසිත නොරිදවා ත්‍යාගය පිළිගත්තේ වුව ද පිංගුත්තර චර්යාව විමසන කළ අනාවරණය වන්නේ ඔහු ආත්ම සංවරය ඇති උසස් දැමුණු පුද්ගලයෙකු බවයි. පසුව පිංගුත්තර කුලී කරුවෙකු ලෙස සේවයේ යෙදී සිටිය දී උදුම්බරා රජදේවිය ඔහුට සිනාසෙයි. එම සරදම් සිනාව මුළුමහත් අධ්‍යාපනයෙන් කෙළ පැමිණි කෙනෙකු කරනට යමක් නොමැතිව ඉබාගාතේ යන උසස් අධ්‍යාත්මික ගුණවගාවකින් හෙබි පිරිසට කරනලද අවඥාවකි (වික්‍රමසිංහ, 2005:141). මෙම සත්‍යය අද්‍යතනයට ද ගැලපෙන යථාර්ථයකි.

උම්මග්ග ජාතකය තුළින් විවාහය පිළිබඳ තොරතුරු රැසක් ම අනාවරණය වෙයි. ප්‍රඥාව හා ලිංගිකත්වය පිළිබඳ පුවතක් ඉන් දිගහැරේ. පරිබ්‍රාජික පැනය ඊට නිදසුන් ය. සත්‍ය නිෂ්පත්තිය සිදු වන්නේ පිරිමින් හරහා බව සාමාන්‍ය පිළිගැනීමයි. තත් පෙරදිග චින්තනය උමංදාව වැනි වැඩවසම් සමාජය පසුබිම් වූ කෘතියක පරිබ්‍රාජිකාවකගේ බුද්ධිය හුවාදක්වයි. අමරාගේ බුද්ධිය ද හුවා දක්වයි. මහෞෂධට බුද්ධිය දෙන්නේ පරිබ්‍රාජිකාවයි. ස්ත්‍රිය එහි දී උත්තමස්ථානයේ තබයි. රාජ්‍යයක ගැටලු විසඳූ මහෞෂධගේ ගැටලු විසඳූවේ ඇයයි. ජීවිතයේ සත්‍යය වටහා දුන්නේ ගැහැනියකි. ඒ අනුව ස්ත්‍රිය පිළිබඳව සාම්ප්‍රදායික ආකල්ප මෙහි දී ඛණ්ඩනය වනවා සේ ම රජ ගෙදර කාන්තාවන්ගේ නොහොබිනා කම් ද නිරූපිත ය.

අමරා, උදුම්බරා, තලතා යන චරිතයන්ගෙන් හා සැළලිහිණියාගේ පුවතින් ද ගැහැනු චරිතගති ලක්ෂණ බොහොමයක් නිරූපණය වේ. අමරා පිටිසරබද නුවණක්කාර චරිතයකි. උදුම්බරා වූ කලී පළමු විවාහයෙන් වෙන් වී රාජ පතිනියක් වීමට වරම් ලද්දී ය. ඇය නිරතුරුව ක්‍රියා කළේ විචක්ෂණශීලී, යුතුකම් ඉටුකරන කාන්තාවක් පරිදි ය. ඈ තම ස්වාමියා මරණින් ගලවාගත් මහෞෂධ කුමරු සහෝදර තනතුරෙහි තබා කටයුතු කළා ය. තලතා දේවියගේ චරිතය කතුවරයා නිරූපණය කරන්නේ, නුවණැති රාජමාතාවක් වුව ද ඉතා පහත් චරිත ලක්ෂණ ඇත්තියක් ලෙසිනි. තම මැණියන්ගේ පහත් ස්වභාවය පුත්‍ර චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මුවට නංවා  කතුවරයා විවරණය කරන අයුරු සර්වකාලීන අගයකින් යුක්ත ය. සදාකාලීන වූ ද විශ්වීය වූ ද ඇතැම් කාන්තාවන්ට ම ආවේණික ගතිස්වභාව මෙයින්  අනාවරණය වේ.

"තමන් දෑ ඉතා වයස් ගතවැ සිට, ස්ත්‍රීන් පළඳනා මිණිමෙවුල්දම් ආදී නොපැළන්ඳ මනාපළඳනා පැළඳ අමාත්‍ය මණ්ඩලය පිරිවරා සිංහාසනාරූඪව උන් කල්හි බොහෝ දෙනාට පෙනෙන පරිද්දෙන් සක්මන් කොට ඇවිදින දෑ ය. පැළැන්ඳ වූ මණිමේඛලා දාමයෙහි ශබ්දය සියලු රජගෙයි ඒක නින්නාද කෙරෙමින් සිටින්නී යැ. අමාත්‍ය මණ්ඩලය මැද උන් මම මුන්වහන්සේ පැළඳි ආභරණයෙහි ශබ්දය නියා දැන ලජ්ජායෙන් කරබාමි. අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවත් නොකට යුත්තක් බලා වදාළ මැනව, මුන්දෑ ඉඳූල් කන්නටත් තරම් නොවූ දෙරටුපාල කොල්ලන් ද ඇත් ගොව්වන් ආදීන් ද කැඳව කැඳවා බොහෝ වේලාවක් උන් හා සමඟ මහත්කොට සිනාසෙන දෑය. මා සතු ප්‍රත්‍යන්ත රජදරුවන්ට මා යැව්වා කොටපත් ලියා යවන කලැ මාගේ මැණියන් දෑ මැහැලි නොවන දෑය. සොළොස් හැවිරිද්දේ

සිටියනටත් මුන්දෑ වඩනා දෑය. මෙනම් රජ්ජුරුවෝ අවුත් තමන් බිරියකොට යෙත්වයි මට සොරාපත් යවන දෑය. රජදරුවෝ පත්බලාපියා හයින් තැතිගෙන නැවත මට පත් එවන කලැ අප තමන් වහන්සේගේ සේවකයන් වුව මෙසේ නොතරම් කටයුතු කියා එවුයේ ඇයි දැයි පත් එවන්නාහ. ඒ ගෙනාපත් සබයෙහි කියන්නට වන් කලැ ඉස්වද්දන තැනක් නැත්තා සේ මහා ලැජ්ජාවෙන් පොළව පැළී නොයන සේ යැයි සිතමි" (උම්මග්ග ජාතකය, මුනිදාස,2000;232).

අනික් සියලු නැන්දම්මා කෙනෙකු මෙන්ම තලතාව ද තම ලේලියවන නන්දා දේවීන් සමඟ සතුරු කමින් කල්පසු කළා ය (සිල්වා,1965:107).

'නැන්දෝ නම් යෙහෙළියනට කුකුළන් හා බළලුන් සේ කෙනෙක, ඇත්තක් තබා නැත්තක් කියා බිඳුවන්නට කියන්නාහ" (උම්මග්ග ජාතකය, මුනිදාස,2000). සජීවී මනුෂ්‍ය ජීවිතයේ සදාකාලීන සත්‍යය මෙමඟින් පසක් වේ.

"සමාජය හා මිනිස් ජීවිතය ප්‍රකට කළ හැකි ප්‍රධාන මාධ්‍යය වන්නේ සාහිත්‍යය හා කලාවයි. චිත්‍ර ශිල්පියෙකුට පුද්ගලයෙකුගේ ජීව චිත්‍රයක් නිරූපණය කිරීම මඟින් එම පුද්ගලයා තුළ ඇති භාවයන් යතාර්ථවාදීව දැක්විය හැකිය. නමුත් එම පුද්ගලයා තුළ පවතින මනෝභාවයන්ට හේතු පැහැදිලි කළ හැක්කේ සාහිත්‍යකරුවාට පමණි. එහෙයින් සාහිත්‍ය, කලාව අභිභවන්නේ ය" (පල්ලියගුරු, 2002:16).

"ඉන්දීය ජනතාවගේ ගති පැවතුම්, චාරිත්‍ර හා විශ්වාස මෙන්ම ඔවුන්ගේ සමාජ ආර්ථික ජීවිතය පිළිබඳව පුළුල් අවබෝධයක් ජාතක කතා මඟින් ලබාගත හැකිය" (Rhys:1976) . ආර්ථික වශයෙන් ධනෙශ්වර හා ධනහීන භේදය පැවතිය හැකි නමුත් එය අද පවතින ආකල්පයට වඩා වෙනස් මුහුණු වරකින් එවකට පැවතිණි. දුප්පත් අය උතුම් නොවෙති. සම්පත් ඇති ධනවතුන් උතුම් ය, යන අදහස පෙරදැරි කරගත් පිරිස එකල සිටිබව පෙනේ. උම්මග්ග ජාතකයේ එන පහත සඳහන් පාඨය එය සනාථ කරයි.

"මහරජ ඇසුව මැනව, ඇතුන් අසුන් ගව මහේෂාදී මුතු මැණික් ආදී රුවන්ද මැණික්මය කුණ්ඩලාභරණ කනක කටක නූපුර යනාදී ආභරණයන්ගෙන්ද ඉසුරු කුලයෙහි උපන්නා වූ දෙවඟනන් හා සමඟ වරඟනන්ද අවශේෂ පරිවාර ජනයාද යන සියල්ලෝම පොහොසත් තැනැත්තහුව උපභෝග පරිභෝග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුප්පත් තැනැත්තහුට එසේ නොවෙති. මේ කාරණයෙනුත් නුවණැත්තෝ උතුම් නොවෙති. මේ සම්පත් ඇත්තෝම උතුම් වෙති" (උම්මග්ග ජාතකය,2000:57).

**නිගමනය**

පැරණි භාරතීය සමාජ සන්දර්භය ගොඩනැගී තිබූ සමාජ, ආර්ථික, මෙන්ම සංස්කෘතික වටපිටාව උම්මග්ග ජාතකය තුළින් මනාව පිළිබිඹු වෙයි. එහි වූ චාරිත්‍ර, වාරිත්‍ර, උත්සව, පංතිගැටුම්, කුල ගැටුම්, බල ගැටුම්, කර්මාන්ත සේම තාක්ෂණික දැනුම පිළිබඳ තොරතුරු ද මෙහි අනල්ප ය. මහෞෂධ හා සේනකාදීන් අතර ඇතිවන්නේ සැබවින් ම කුල අර්බුදයක් නොවන බව අපගේ චින්තනය මෙහෙයවීමෙන් පැහැදිලි වේ. සේනකාදී පුරෝහිතයන් වනාහි

පරම්පරා සහගත බලයකින් හෙබියෝ වෙති. එනමුත් මොවුහු බුද්ධි හීනයෝ වෙති. එබැවින් තත් කතා පුවත දිගහැරෙන්නේ බුද්ධිමතුන්ගේ හා බුද්ධිහිනයන්ගේ ගැටුමක් වශයෙනි. බුද්ධිහීනයන්ගේ ගොඩට නොවැටුණු බුද්ධිමතෙකුගේ ස්වාධීනත්වය පිළිබඳ කතා පුවතකි. උමංදාව වනාහි කුල මදයෙන් ද, ඥාන මදයෙන් ද මත් වී ඥාන සම්භාරය තමාට ම සින්නක්කර කොට ගන්ට තැතණු බමුණන්ටත්, ඔවුන් විසින් අනුශාසිත රාජ්‍ය තන්ත්‍රයටත් එල්ල කරනලද තියුණු උපහාසාලාපයක් වැන්න (ගම්ලත්, 1995:5).

"පෞරාණික ඉන්දියාවේ සමාජ ජීවිතය හා චාරිත්‍ර පිළිබඳ නිරවුල් අවබෝධයක් ජාතක කතා මඟින් ලබාගත හැකිය" (Crowell:1973) . ඒ අනුව උමංදාවෙන් නිරූපණය වන්නේ බමුණු කුලය පරදා ගොවි කුලය ඉස්මතුවීම පිළිබඳ කතාන්දරයක් පමණක් ම නොවේ. මෙහිදී තත්කාලීන දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික විෂය පරාසය විවරණය වනවා සේ ම මින් නිරූපිත මනුෂ්‍ය චින්තනය විශ්වීය බවකින් හොබනේය. මෙහි වූ සජීවී චරිත සදාකාලයට ම වලංගු වන්නේය. එබැවින් උම්මග්ග ජාතකය වනාහි කුල අර්බුදයට අභිබවා ගිය සර්වකාලීන සමාජ යථාර්ථ නිරූපණයක පැතිකඩක් ලෙස සැලකීම යුක්ති යුක්ත වන්නේ ය..

### ආශ්‍රිත ග්‍රන්ථ


අබේවර්ධන, ඇල්, (2004), ***පැරණි ඉන්දියාවේ රාජ්‍යය සහ ආණ්ඩුව***, නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ.

***උම්මග්ග ජාතකය,*** (2000), සංස්. කුමාරතුංග මුනිදාස, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

***උම්මග්ග ජාතකය***, (1966), සංස්. සුචරිත ගම්ලත්,ඊ.ඒ. වික්‍රමසිංහ, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

***එළු උමංදාව***, (1950), සංස්. පරවාහැර පේමානන්ද, ගලගම ධම්මික, කැළණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය.

කුලසූරිය, ආනන්ද, (1997), ***සිංහල සාහිත්‍යය 04,*** බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

ගම්ලත්, සුචරිත, (1977), ***උම්මග්ග ජාතක ප්‍රවේශය***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දනන්සූරිය, ජිනදාස, (2001), ***සමාජ සාහිත්‍ය සම්මර්ශන***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ද සිල්වා, එච්. එම්. පීටර්, (1965), ***උමංදා විනිස***, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

පඤ්ඤාකිත්ති, හිරිපිටියේ, (2001), ***පුරාතන රාජ්‍යපාලන මූලධර්ම***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

***පන්සිය පනස් ජාතකය***, (1996), සංස්. වතුවත්තේ පේමානන්ද, 1 2 කාණ්ඩ.

පල්ලියගුරු, චන්ද්‍රසිරි, (2002), ***සාහිත්‍ය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, බී. ඒ. ටෙනිසන්, (1993), ***ජාතක කතාවල සමාජ විද්‍යාත්මක ලක්ෂණ***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රනන්ද, කුලියාපිටියේ, (1985), ***ජාතක කතා සාහිත්‍යයේ විමුක්ති දැක්ම***, කොළඹ: සරසවි ප්‍රින්ටර්ස්.

මහේන්ද්‍ර, සුනන්ද, (1996), ***ජාතක කතා සම්ප්‍රදාය***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්, (1965), ***ජාතකපොත් විමසුම***, ප්‍රදීප ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්, (1956), ***බණකතා සාහිත්‍ය***, මහරගම: සමන් මුද්‍රණාලය.

වික්‍රමසිංහ, මාර්ටින්, (2007), ***මානව විද්‍යාව හා සිංහල සංස්කෘතිය***, රාජගිරිය: සරස ප්‍රකාශකයෝ .

වික්‍රමසිංහ, මාර්ටින්, (1991), ***සිංහල සාහිත්‍යයේ නැගීම***, දෙහිවල: තිසර ප්‍රකාශකයෝ.

සන්නස්ගල, පුංචිබණ්ඩාර, (1961), ***සිංහල සාහිත්‍ය වංශය,*** කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්.

සූරවීර, ඒ. වී, (2002), ***සමාජීය සාහිත්‍යය අධ්‍යයනය***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Crowell, E.B, (1973), ***The Jathakes or stories of the Buddha's former births***.

Rhys, Davids, T .W, (1959), ***Buddhist India***, Culcutta; Susil Gupta.

Surmellan, Leon, (1969), ***Techniques of fiction writing***, introduction by Mark Schorer, p.viii.